# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2192/44 - 2020 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පෙත්සම පිළිබඳ දැන්වීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 32 සහ 37 දරන වගන්ති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණයේ අධීක්ෂණයට යටත්ව සීමාසහිත සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් සමාගම (පීබී 858) ගණන් බේරා වසා දැමීම

ඒ අනුව, මුදල් ව්‍යාපාර පනතේ 37(5) වගන්තියේ ප්‍රකාශිත ප්‍රතිපාදන වලට යටත්ව,

ඉහත නම් දරන සමාගම කොළඹ වාණිජ මහාධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් 2019 දෙසැම්බර් මස 03 වැනි දින, කොළඹ 01 පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට අධ්‍යක්ෂ වූ වීරප්පුලිගේ රණවීර යන අය විසින් එකී අධිකරණයට ඉදිරිපත් කරන ලද බව ද, ඉහත කී පෙත්සම 2020 නොවැම්බර් මස 30 වැනි දින අධිකරණය ඉදිරියේ විභාගයට ගනු ලැබීමට නියම කර ඇති බව ද, සහ එකී පෙත්සම මත ආඥාවක් කරනු ලැබීම තහවුරු කිරීමට හෝ ඊට එරෙහි වීමට හෝ උත්සුක වන ඉහත කී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට එකී කාර්යය සඳහා නඩු විභාගයේ දී තමාම හෝ ඒ තැනැත්තාගේ නීතිඥවරයා මගින් පෙනී සිටීමට හැකි බව ද, පෙත්සමේ පිටපතක් එය අවශ්‍ය කරන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන යොදා ඇති තැනැත්තා විසින් නියම කරන ලද ගාස්තුව ගෙවීම මත සපයනු ඇති බව ද මෙයින් දන්වනු ලැබේ.

අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

සටහන.- එකී පෙත්සම විභාගයේ දී පෙනී සිටීමට අදහස් කරන ඕනෑම තැනැත්තකු ඔහුගේ එකී අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් ඉහත සඳහන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත භාර දීම හෝ තැපෑලෙන් යැවීම කළ යුතු ය. දැන්වීමෙහි, තැනැත්තාගේ නම සහ ලිපිනය, හෝ ආයතනයක් නම් ආයතනයෙහි නම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර, තැනැත්තා විසින් හෝ ආයතනය විසින් හෝ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු අතර, 2020 නොවැම්බර් මස 28 දින මධ්‍යහ්න 1 පසු වීමට පෙර භාර දීම හෝ තැපෑලෙන් යවන්නේ නම්, ඉහත නම් දරන අය වෙත ළඟා වීමට ප්‍රමාණවත් කාලයක් සහිතව යවනු ලැබීම කළ යුත්තේ ය.

09 - 491